**සාමාන්‍ය අධ්‍යාපන නවීකරණ ව්‍යාපෘතිය සංරචක II - 2022**
-----------------------------------------------------------------
සාමාන්‍ය අධ්‍යාපන නවීකරණ ව්‍යාපෘතිය සංරචක II 2022 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන, ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජය හා ජාත්‍යන්තර සංවර්ධන සමායතනය අතර 2018 ජූලි 25 දින එළඹි අංක 6228 LK දරන ණය ගිවිසුමේ 5.09 වගන්තිය සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාරව මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. පාර්ලිමේන්තුවට වාර්තා කළයුතු යැයි මා සලකන මාගේ අදහස් හා නිරීක්ෂණ මෙම වාර්තාවේ දැක්වේ.

## 1.2 ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම, අරමුණු, අරමුදල් යෙදවීම හා කාලය

ණය ගිවිසුම අනුව, අධ්‍යාපන අමාත්‍යාංශය ව්‍යාපෘතිය ක්‍රියාත්මක කරවීමේ හා ක්‍රියාත්මක කිරීමේ නියෝජිතායතනය වේ.
සාමාන්‍ය අධ්‍යාපන ක්‍රමයේ ගුණාත්මකභාවය වැඩි දියුණු කිරීම සහ භාරකාරත්වය ශක්තිමත් කිරීම ව්‍යාපෘතියේ අරමුණු වේ. ප්‍රාථමික හා ද්විතීයික අධ්‍යාපනයේ ගුණාත්මකභාවය ඉහළ නැංවීම සහ භාරකාරත්වය ශක්තිමත් කිරීම, ව්‍යාපෘති වැඩසටහන් ක්‍රියාත්මක කිරීම සහ තාක්ෂණික සහාය යන සංරචක දෙකක් යටතේ ව්‍යාපෘතියේ කටයුතු ක්‍රියාත්මක වේ.
ණය ගිවිසුම අනුව, ව්‍යාපෘතියේ ඇස්තමේන්තුගත මුළු පිරිවැය රු. මිලියන 449,645 කට සමාන වූ එජඩො මිලියන 2,900 වන අතර ඉන් රු. මිලියන 15,505 කට සමාන වූ එජඩො මිලියන 100 ක් සැපයීම සඳහා ජාත්‍යන්තර සංවර්ධන සමායතනය සමඟ එකඟ වී තිබුණි. ඉතිරි මුදල රු. මිලියන 434,140 ක් ශ්‍රී ලංකා රජය විසින් මූල්‍යනය කිරීමට බලාපොරොත්තු වේ.
ව්‍යාපෘතියේ කටයුතු 2018 අගෝස්තු 30 දින ආරම්භ කරන ලද අතර, 2024 ජූනි 30 දින වනවිට නිම කිරීමට සැලසුම් කර තිබුණි.

## 1.3 තත්ත්වාගණනය කළ මතය

මෙම වාර්තාවේ 2.1 වගුවේ දක්වා ඇති කරුණු වලින් වන බලපෑම් හැර, මූල්‍ය ප්‍රකාශන වලින් 2022 දෙසැම්බර් 31 දිනට ව්‍යාපෘතියේ මූල්‍ය තත්ත්වය, වියදම් ප්‍රකාශය සහ එහි මුදල් ප්‍රවාහය ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිති වලට අනුකූලව සත්‍ය හා සාධාරණ තතත්වයක් පිළිඹිබු කරන බව මා දරන්නා වූ මතය වේ.

## 1.4 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර) අනුකූලව මා විසින් විගණනය සිදුකරන ලදී. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

## 1.5 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ කළමනාකරණයේ සහ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිති වලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර වූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

ව්‍යාපෘතියේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය පරීක්ෂා කිරීම සම්බන්ධ වගකීම, පාලනය කරන පාර්ශවයන් විසින් දරනු ලබයි.

## 1.6 මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැමවිටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, එහි ප්‍රමාණාත්මක භාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන් ,චේතනාන්විත මඟහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද ,අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබාගන්නා ලදී.

- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය, ගිණුම්කරන ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම් අගයන ලදී.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුලත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ත ඉදිරිපත් කිරීම අගයන ලදී.

මාගේ විගණනය තුළදී හඳුනාගත් වැදගත් විගණන සොයාගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දුර්වලතා හා අනෙකුත් කරුණු පිළිබඳව පාලනය කරනු ලබන පාර්ශවයන් දැනුවත් කරන ලදී.

## 2. මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

### 2.1 ගිණුම්කරණ අඩුපාඩු

| | ගිණුම්කරණ අඩුපාඩු | වටිනාකම රු. මිලියන. | කළමනාකරණයේ ප්‍රතිචාරය | විගණකගේ නිර්දේශය |
|---|---|---|---|---|
| (අ) | සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශනයේ ව්‍යාපෘති වියදම් පෙන්වා නොතිබුණි. | 65.4 | භාණ්ඩාගාර මෙහෙයුම් දෙපාර්තමේන්තුව විසින් සංරචක II හි වියදම් ගිණුම්ගත කරනු ලැබේ. ඒ අනුව 2022 දෙසැම්බර් මාසයේ වියදම් වූ රු.65,443,738.15ක් භාණ්ඩාගාර මෙහෙයුම් දෙපාර්තමේන්තුවට ඉදිරිපත් කිරීම ප්‍රමාද වීම හේතුවෙන් 2023 වර්ෂයේදී සටහන් වූ බව. | මූල්‍ය ප්‍රකාශනයේ නිවැරදි වියදම් ප්‍රමාණය ගිණුම්ගත කළ යුතුය. |

| | | | | |
|---|---|---|---|---|
| (ආ) | ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ 261 ගිණුම්කරණ ප්‍රමිති 5 හි 43(අ) වගන්තියට අනුව එක් එක් මූල්‍ය තත්ත්වය ප්‍රකාශය සඳහා වත්කම් සහ බැරකම් මූල්‍ය තත්ත්වය ප්‍රකාශ කිරීමේ අවසාන දිනට විදේශ විනිමය අනුපාතයට පරිවර්තනය කළ යුතුය. කෙසේ වෙතත්, ඉහත අවශ්‍යතාවයට අනුව ව්‍යාපෘතියේ විදේශ ණය සම්බන්ධ සමානාත්මතා ගැලපීම සමාලෝචිත වර්ෂය සඳහා ගිණුම්ගත කර නොතිබුණි. | | සමානාත්මතා ගැලපුම් වටිනාකම් 2024 ගිණුම්වල මූල්‍ය ප්‍රකාශනයේ සටහනක් ලෙස ගිණුම්ගත කරන බව. | මූල්‍ය තත්ත්වය අවසන් විදේශ විනිමය අනුපාතයට පරිවර්තනය කළ යුතුය |

## 2.2 නීතිරීති හා රෙගුලාසිවලට අනුකූල නොවීම

| අංකය | නීතිරීති හා රෙගුලාසි වලට යොමුව | අනුකූල නොවීම | කළමනාකරණයේ ප්‍රතිචාරය | විගණකගේ නිර්දේශය |
|---|---|---|---|---|
| (අ) | 2019 මාර්තු 15 දිනැති අංක 01/2019 දරණ කළමනාකරණ සේවා චක්‍රලේඛයේ 9.3 ඡේදය සහ ව්‍යාපෘති මෙහෙයුම් අත්පොතෙහි 5.1 වගන්තිය. | රේඛීය අමාත්‍යාංශයේ ලේකම් / පළාත් සභා ප්‍රධාන ලේකම් විසින් ව්‍යාපෘති මෙහෙයුම් කමිටුව අවම වශයෙන් මාස 02කට වරක් රැස්වන බවට සහතික විය යුතුය. කෙසේ වෙතත් සමාලෝචිත වර්ෂය සඳහා පවත්වා ඇත්තේ එක් මෙහෙයුම් කමිටුවක් පමණි. | අධ්‍යාපන අමාත්‍යාංශය සහ රාජ්‍ය පරිපාලන, ස්වදේශ කටයුතු, පළාත් සභා සහ පළාත් පාලන අමාත්‍යාංශය යන දෙඅංශයෙන්ම මෙහෙයුම් කමිටු රැස්වීම් පවත්වනු ලැබේ. එම රැස්වීම් සමඟ අධ්‍යාපන අමාත්‍යාංශයද සහභාගී වන බව. | චක්‍රලේඛය සහ මෙහෙයුම් අත්පොතට අනුකූලව කටයුතු කළ යුතුය. |
| (ආ) | ව්‍යාපෘති ඇගයීම් ලේඛනයේ 96 ඡේදය | අභ්‍යන්තර විගණනය අධ්‍යාපන අමාත්‍යාංශයේ අභ්‍යන්තර විගණන ඒකකය මගින් සිදු කළ යුතුය. 2022 වර්ෂය සඳහා අධ්‍යාපන අමාත්‍යාංශයේ අභ්‍යන්තර විගණන ඒකකය විසින් ඉදිරිපත් කරන ලද අභ්‍යන්තර විගණන සැලැස්මෙහි පොදුවේ විදේශ ආධාර වැඩසටහන් සම්බන්ධීකරණය, නියාමනය සහ ඇගයීම ලෙස සඳහන් කර තිබුණ ව්‍යාපෘතියට අදාළව කිසිදු විගණන ක්‍රියාකාරකමක් හඳුනාගෙන හෝ ක්‍රියාත්මක කර නොතිබුණි. | අදහස් ඉදිරිපත් කර නොතිබුණි. | අභ්‍යන්තර විගණනයක් ක්‍රියාත්මක කළ යුතුයි. |

## 3. භෞතික කාර්යසාධනය

### 3.1 ව්‍යාපෘතියේ කටයුතු පිළිබඳ භෞතික ප්‍රගතිය

| සංරචකය | ක්‍රියාකාරකම | 2022 දෙසැම්බර් 31 දිනට | | ප්‍රමාදය / විගණන නිරීක්ෂණය | ප්‍රමාදයට හේතු |
|---|---|---|---|---|---|
| II | | අපේක්ෂිත භෞතික කාර්යසාධනය | ළඟා කරගෙන ඇති කාර්යසාධනය | | |
| | | ඒකක/ ප්‍රතිශතක | ඒකක/ ප්‍රතිශතක | | |
| | ක්‍රියාකාරී සැලැස්ම සහ ප්‍රගති වාර්තාව. | 100 | විගණනය සඳහා ඉදිරිපත් කර නැත | 2022 වසර සඳහා වන ප්‍රගති වාර්තාව ඉදිරිපත් කර තිබුණද, 2022 වර්ෂය සඳහා වූ ක්‍රියාකාරී සැලැස්ම විගණනයට ඉදිරිපත් නොකිරීම නිසා සමාලෝචිත වර්ෂයේ ලබා ඇති ප්‍රගතිය පරීක්ෂා කිරීමට විගණනයට නොහැකි විය. | සිව්වන කාර්තුවේදී වාර්ෂික සම්පූර්ණ අයවැය වෙනස් කර ඇත. |

**කළමනාකාරීත්වයේ ප්‍රතිචාර** 2022 සිව්වන කාර්තුවේදී වාර්ෂික සම්පූර්ණ අයවැය වෙනස් කර ඇති අතර, සැලැස්ම වෙනස් කිරීම අමතර කාලයක් අවශ්‍ය වන අමතර කාර්යයක් විය. 2023 සහ ඉදිරියට ක්‍රියාවලිය සුමට කිරීමට පියවර ගන්නා ලද බව.

**විගණකගේ නිර්දේශයන්** එක් එක් සංරචක සඳහා ක්‍රියාකාරී සැලැස්ම සහ ප්‍රගති වාර්තාව සකස් කිරීමට ක්‍රියා කළ යුතුය.

### 3.2 පද්ධති හා පාලනය

| විගණන නිරීක්ෂණය | කළමනාකරණයේ ප්‍රතිචාරය | විගණකගේ නිර්දේශය |
|---|---|---|
| 2022 වර්ෂය සඳහා ක්‍රියාකාරකම් 04ක් සඳහා රුපියල් මිලියන 175ක වියදම් ඇස්තමේන්තුවක් සකස් කර තිබූ අතර ඉන් අනතුරුව සිව්වන කාර්තුවේ කටයුතු 05ක් සඳහා එය මිලියන 185.7ක් ලෙස සංශෝධනය කර ඇත. තවද, 2022 දෙසැම්බර් 20 වන දින ඇස්තමේන්තුව රුපියල් මිලියන 167.7 දක්වා නැවත සංශෝධනය කරන ලදී. ඒ අනුව, II සංරචකය යටතේ අපේක්ෂිත කාර්යයන් ඉටු කිරීම සඳහා නිසි මූලා‍ය සැලැස්මක් ක්‍රියාත්මක කර නොමැති බව නිරීක්ෂණය විය. | සිව්වන කාර්තුවේ සිදු වූ ආණ්ඩු වෙනස හේතුවෙන් 2022 වසර සඳහා වන අයවැය අයවැය දෙපාර්තමේන්තුව විසින් සංශෝධනය කර ඇති අතර, ඒ අනුව AIP සහ GEMP අයවැය සංශෝධනය කිරීමට සිදු විය.<br>කෙසේ වෙතත්, ක්‍රියාත්මක කිරීමේ අදියරේදී අදාළ නිලධාරීන් අමතර අයවැය ප්‍රතිපාදන හෝ ප්‍රතිපාදන අඩු කිරීම සඳහා ඉල්ලීම් කරන බව. | විධිමත් මූලා‍ය සැලැස්මක් ක්‍රියාත්මක කිරීමට කටයුතු කළ යුතුයි. |